# බුදුදහමින් ප්‍රකාශිත
# කර්ම, විපාක, සසර හා සසරින් මිදීම

## කර්ම

කයින්, සිතින් හෝ වචනයෙන් යමක් කිරීම කර්මයයි. බුදුදහමට අනුව යමක් කර්මය වන්නේ සිතින් සිතා කයින් වචනයෙන් සිතින් එය සිදු කිරීමෙනි (*චේතනාහං භික්ඛවෙ කම්මං වදාමි, චෙතයිත්වා කම්මං කරොති කායෙන වාචාය මනසා,* නිබ්බේධික සුත්ත, අං.නි. vi, 208 පිට). කර්මය වූ කලි ආධ්‍යාත්මික ශක්ති විශේෂයකි. කර්මය අදෘශ්‍යමාන නමුදු ඉන් ජනිත වන කර්මඵලය දෘශ්‍යමාන වූවකි. කර්මයට අදාළ වූ චේතනාව පටිච්චසමුප්පන්න වූ චෛතසික ධර්මයකි. එය ස්පර්ශ, වේදනා, සංඥා, ඒකග්ගතා, ජීවිතින්ද්‍රිය හා මනසිකාර යන චෛතසික සමග සම්බන්ධිත වූ ධර්මයකි. යමක් කර්මයක් බවට පත්වන්නේ එය සචේතනාත්මක ව කිරීමෙනි. එසේ නොවුණු විට පුණ්‍ය පාප සිදු නොවේ (*නත්ථි පාපං අකුප්පතො*). කුසල - අකුසල වශයෙන් කර්මය දෙවැදෑරුම් වන අතර ඊට අමතරව බුදුදහමෙහි සූත්‍ර පිටකයෙහි **සුකට - දුක්කට, සෙවිතබ්බ - අසෙවිතබ්බ, සුක්කධම්ම - කණ්හධම්ම, පුඤ්ඤ - පාප, භබ්බ - අභබ්බ යන පද ව්‍යවහාර වේ.** මෙහිලා කුසල යනු තමාටත් අනුන්ටත් යහපත හිතසුව පිණිස පවත්නා ක්‍රියා ය. අකුසල යනු තමාටත් අනුන්ටත් අයහපත අවැඩ පිණිස පවත්නා ක්‍රියා ය. බුදුදහමින් අපට මඟ පෙන්වන්නේ පළමුව අකුසල කර්මයන්ගෙන් වැළකී කුසල කර්මයන්හි නිරතව සුගතියට පදනම දමා ගැනීමටත් අනතුරුව ධර්ම චක්‍රය උපයෝගී කරගෙන කර්ම චක්‍රයෙන් සදහට අත්මිදීමටත් ය.

සර්වඥතා ඥානය සාක්ෂාත් කිරීමත් සමග ලැබුණු චුතූපපාත ඤාණය මගින් සත්ත්වයා කර්මානුරූපව යළි භවයක ප්‍රතිසන්ධිය ලබන ආකාරය පිළිබඳව බුදුරජාණන් වහන්සේට පැහැදිලිව අවබෝධ විය. මෙහිලා සත්ත්වයන්ගේ ප්‍රතිසන්ධියට හේතුවන ප්‍රධාන සාධකය කර්මය බව උන්වහන්සේ මැනැවින් පසක් කළහ. ගෙවල් දෙකක් අතර සිටින ඇස් ඇති පුරුෂයකුට එක් නිවසකින් නික්ම තවත් නිවසකට පිවිසෙන තැනැත්තකු මැනැවින් දර්ශනය වන්නාක් මෙන් බුදුරජාණන් වහන්සේට සත්ත්වයන් එක් භවයකින් ච්‍යුත වී නැවත භවයක ප්‍රතිසන්ධි ලබන ආකාරය මැනැවින් ප්‍රත්‍යක්ෂ විය. එහි දී උපදින සත්ත්වයන් බොහෝ දෙනකු දුගතිගාමී වන අයුරු දැක ලෝක සත්ත්වයා කෙරෙහි බලවත් සංවේගයක් හටගත් බුදුරජාණන් වහන්සේ මේ තත්ත්වය ලෝකයාට අවබෝධ කරලීමට ඉමහත් වෙහෙසක් දරමින් ධර්මදේශනා කළහ. උන් වහන්සේගේ මූලික අපේක්ෂාව වූයේ සුගතියට යන මාවත (ස්වර්ග මාර්ගය) හා නිවන් දකින මාවත (මෝක්ෂ මාර්ගය) ලොවට දේශනා කිරීමයි. එහිලා පෘථග්ජනයන් සේඛයන් කරලීමත් සේඛයන් අසේඛයන් කිරීමත්, අසේඛයන් පිරිනිවන තෙක් සුවසේ වෙසෙනු දැකීමත් බුදුරදුන්ගේ අපේක්ෂාව විය. **මේ සඳහා අපාගත වීමට සිටියවුන්ට කම්මස්සකතා සම්මා දිට්ඨිය ලබා දී ඔවුන් සුගතියෙහි පිහිටුවීමට ද කම්මස්සකතා සම්මාදිට්ඨිය ලැබූවන්ට චතුසච්ච සම්මා දිට්ඨිය ලබා දී ඔවුන් නිවනෙහි හික්මවීමට ද අනුශාසනා කළහ.** බුදුරජාණන් වහන්සේ ලොව පහළ වන සමය වන විට ද ඇතැමුන් යළි ඉපදීම හා කර්මය පිළිබඳ විශ්වාස කොට තිබුණ ද ඔවුන් එය විශ්වාස කළේ ශාස්වත දෘෂ්ටිය මත පිහිටා ය. බුදුදහමෙහි පවත්නා විශේෂත්වය වන්නේ ශාස්වත හා උච්ඡේද යන දෘෂ්ටි දෙකෙහි ම නොපිහිටා පටිච්ච සමුප්පාදය හෙවත් හේතුඵ දහම මත පදනම් ව කර්මය විග්‍රහ කිරීමයි.

කර්මය හා ඉන් ජනිත වන ඵලය පිළිබඳව පරතෙරට සිතා අවසන් කළ නොහැක. එබැවින් කර්ම සංකල්පය වූ කලි අචින්තනීය වූවක් (unconjecturable subjet) බව සඳහන් වේ (අචින්තෙය්‍ය සුත්ත, අ.නි.). රහත් උතුමකුට වුව ද කර්මය පිරිසිඳ දත නොහැක. එය සම්මා සම්බුදුවරයකුට ම විෂයය වූවකි. එසේ වුව ද තමා කර්මය ස්වකීය කොට ඇත්තෙක්, කර්මය දයාද කොට ඇත්තෙක්, කර්මය ජනිත කොට ඇත්තෙක්, කර්මය ඥාති කොට ඇත්තෙක්, කර්මය පිළිසරණ කොට ඇත්තෙක් බවත් යහපත් වූ හෝ අයහපත් වූ හෝ යම් කර්මයක් කරයි ද එය දයාද කොට ඇත්තෙක් බවත් ස්ත්‍රී - පුරුෂ, ගිහි - පැවිදි සැවො ම විසින් නිතර සිහි කළ යුතු බව අභිණ්හ පච්චවෙක්ඛණ සූත්‍රයෙහි සඳහන් වේ (*කම්මස්සකොම්හි කම්මදායාදො කම්මයොනි කම්මබන්ධු කම්මපටිසරණො යං කම්මං කරිස්සාමි කල්‍යාණං වා පාපකං වා තස්ස දායාදො භවිස්සාමීති අභිණ්හං පච්චවෙක්ඛිතබ්බං....,* අභිණ්හපච්චවෙක්ඛණ සුත්ත, අං.නි. III).

බුදුරදුන් දිවමන් සමයෙහි කර්මය පිළිබඳව භාරතයෙහි පැවැති ප්‍රධාන වාද තුනකි. එනම්,

1. පුබ්බේකතහේතුවාදය
2. ඉස්සරනිම්මාණවාදය
3. අහේතු අප්පච්චයවාදය (තිත්ථායතන සුත්ත, අං.නි. 310 පිටුව)

පුබ්බේකතහේතුවාදය යනු සියල්ල පෙර කර්මයේ ප්‍රතිඵල වශයෙන් සිදු වේය යන අදහසයි. මෙම අදහස ගත්තවුන් අතර නිගණ්ඨ නාතපුත්ත හෙවත් ජෛන මහාවීර ප්‍රධාන ය. ඉස්සරනිම්මාණවාදය යනු ලෝක නිර්මාපක ඊශ්වරයාගේ කැමැත්ත පරිදි සියලු යහපත - අයහපත සිදු වේ ය යන අදහසයි. සියල්ල කිසිදු හේතුඵල දහමකින් තොර ව ඉබේ ම සිදුවේය යන අදහස අහේතුකඅප්පච්චයවාදයෙන් කියැවේ. මක්ඛලී ගෝසාල මෙම අදහසෙහි දැඩි ව එල්බ ගෙන සිටියෙකි. එබැවින් මක්ඛලී ගෝසාල තරම් අනර්ථකාරී අන් කිසිවකු නොමැති බව බුදුසමයෙහි සඳහන් වේ. මෙම වාද තුනට ම පදනම් වී ඇත්තේ ශාස්වත හෝ උච්ඡේද දෘෂ්ටි ය. එබැවින් අන්තද්වය මිශ්‍රිත මේ වාද තුන ම බැහැර කරන භාග්‍යවතුන් වහන්සේ හේතු ඵල දහමට අනුකූල ව අනාමත්මවාදය මත පදනම් ව ලොව ක්‍රියාත්මක වන කර්මඵලවාදයක් හඳුන්වා දුන්හ.

## චුල්ලකම්මවිභංග සූත්‍රය

මජ්ඣිම නිකායේ චුල්ලකම්මවිභංග සූත්‍රයට අනුව දිනක් බුදුරදුන් වෙත පැමිණි තොදෙය්‍ය පුත්ත සුභ මානවකයා **අල්පායුක - දීඝායුක, බව්හාබාධ - අප්පාබාධ, දුබ්බණ්ණ - වණ්ණවන්ත, අප්පසක්ක - මහෙසක්ක, අප්පභොග - මහාභොග, නීචකුලීන - උච්චකුලීන, දුප්පඤ්ඤ - පඤ්ඤවන්ත** වශයෙන් ලොව මිනිසුන් අතර පවත්නා වෙනසට හේතු විමසීය. ඊට බුදුරදුන්ගේ පිළිතුර වූයේ මෙම උස් පහත් භේදයට හේතුව කර්මය බවත් කර්මය සත්ත්වය හීන ප්‍රණීත වශයෙන් බෙදා ඇති බවත් ය (*කම්මස්සකා මානව, සත්තා කම්මදායාද, කම්මයොනි කම්මබන්ධු කම්මපටිසරණා. කම්මං සත්තෙ විභජති යදිදං හීනප්පණීතතා,* ම.නි. III, චුල්ලකම්මවිභංග සුත්ත, 432 පිට). අනතුරුව එම වෙනස්කම්වලට හේතු සවිස්තරාත්මක ව විස්තර කළහ. ඒ අනුව,

- ප්‍රාණඝාතය හේතුවෙන් ආයුෂ අඩු වන බව ද,
- ප්‍රාණඝාතයෙන් වැළකීමෙන් ආයුෂ වැඩි වන බව ද,
- සතුන්ට හිංසා කිරීමෙන් බොහෝ ආබාධ ඇති වන බව ද,
- සතුන්ට හිංසා කිරීමෙන් වැළකීමෙන් ආබාධ අඩු වන බව ද,
- ක්‍රෝධය බහුල වීමෙන් දුර්වර්ණ වන බව ද,
- ක්‍රෝධ නොකිරීමෙන් ප්‍රියජනක (වර්ණවත්) වන බව ද,
- ඊර්ෂ්‍යාව හේතුවෙන් අල්පේශාක්‍ය වන බව ද,
- ඊර්ෂ්‍යා නොකිරීමෙන් මහේශාක්‍ය වන බව ද,
- දන් නොදීම හේතුවෙන් අල්පභෝග වන බව ද,
- දන් දීම හේතුවෙන් මහාභෝග වන බව ද,
- මානාධික වීමෙන් පහත් කුලයන්හි උපත සිදු වන බව ද,
- මානාධික නොවීමෙන් උසස් කුලයන්හි උපත සිදු වන බව ද,
- විමසා බලා ක්‍රියා නොකිරීමෙන් නුවණ මද වන බව ද,
- විමසා බලා ක්‍රියා කිරීමෙන් නුවණ ඇති වන බව ද

සඳහන් කර ඇත.

මෙලෙස සත්ත්වයාගේ ජීවන ක්‍රියාවලියට කර්මය සුවිශේෂී බලපෑමක් සිදු කරන නමුදු කර්මයෙන් සියල්ල සිදුවේ ය යන්නක් බුදුදහමින් නොකියැවේ. එහි දී **ලෝකයේ සජීවී - අජීවී සියල්ල සිදුවන නියාම ධර්ම පහක් හඳුන්වා දී ඇත. එනම් උතු නියාම, බීජ නියාම, කම්ම නියාම, ධම්ම නියාම, චිත්ත නියාම වශයෙනි.** කර්මය යනු මෙම නියාම ධර්ම පහෙන් එකක් පමණි. තවද සත්ත්වයන්ට සැපදුක් අත්විඳීමට හේතු අටක් පිළිබඳ ව සංයුක්ත නිකායෙහි මොළිය සීවක සූත්‍රයෙහි (සං.නි. IV, 436 පිට) දක්වේ. එනම්: **වාතය, පිත, සෙම, සන්නිපාතය (තුන්දෙස් එක්වීම), ඍතු වෙනස්වීම, විෂම හැසිරීම, උපක්‍රම, බලවත් අකුසල කර්මයන්හි විපාක වශයෙනි.** මෙම හේතු අට අතුරින් සැපදුක් ජනිත වීමට හේතුවන කරුණක් ලෙස කර්මය දක්වා ඇති අතර එය එක ම හේතුව නොව එක් හේතුවක් පමණක් බව ද වටහා ගත යුතු ව ඇත. ගිරිමානන්ද සූත්‍රයෙහි (අ.නි.

VI, 198 පිට) රෝග හටගැනීමට හේතු වශයෙන් ද මෙම කරුණු අට එලෙසින් ම දක්වේ. එයින් ද පැහැදිලි වන්නේ රෝගපීඩා ඇතිවීමට බලපාන කරුණු අතර කර්මය එක් කරුණක් පමණක් බවයි.

කර්මය තෙවැදෑරුම් වශයෙන් බුදුසමයෙහි විස්තර වේ. එනම් **කාය කර්ම, වචී කර්ම හා මනෝ කර්ම** වශයෙනි. බුදුරදුන් සමයෙහි ඇතැම් ආගම්වල මෙය කාය දණ්ඩ, වචී දණ්ඩ මනෝ දණ්ඩ වශයෙන් විග්‍රහය කොට තිබුණි. බුදුරජාණන් වහන්සේ 'දණ්ඩ' යන්න බැහැර කොට ඒ වෙනුවට 'කම්ම' (කර්ම) යන්න හඳුන්වා දුන් අතර මෙම කර්මත්‍රය අතුරින් මනෝ කර්මය වඩාත් ප්‍රබල බව දීඝතපස්සී නම් ජෛන තැනැත්තාට දේශනා කළහ (*ඉමෙසං ඛො තපස්සී තිණ්ණං කම්මානං........ මනොකම්මං මහාසාවජ්ජතරං පඤ්ඤපෙමි පාපස්ස කම්මස්ස කිරියාය පාපස්ස කම්මස්ස පවත්තතියා, නො තථා කායකම්මං නො තථා වචීකම්මං,* ම.නි.I). ඇතැම් කායික හා වාචසික ක්‍රියාවන්ට වඩා මනෝ කර්මය බලවත් බවත් එහි ප්‍රතිඵල වශයෙන් ඇතැමුන් ලොවට මහත් අනර්ථයන් සිදු කළ බවත් ධර්මයෙහි දක්වේ. තව ද සත්ත්වයා සිදු කරන සියලු ක්‍රියාවන්ට මනස ප්‍රධාන වන බව ද අවධාරණය කොට තිබේ. ප්‍රදුෂ්ඨ වූ සිතින් යුතු ව කරන ක්‍රියා හා කතා තුළින් ගොනා පිටුපස එන රිය සක මෙන් (*චක්කං'ව වහතො පදං*) සත්ත්වයාට දුක් විඳීමට සිදු වන බවත්, ප්‍රසන්න සිතින් යුතු ව කරන ක්‍රියා හා කතා තුළින් තමා පිටුපස එන ඡායාව මෙන් (*ඡායා'ව අනපායිනී*) සත්ත්වයාට සැප විඳීමට හැකි වන බවත් ධම්මපදයෙහි සඳහන් වේ (ධ.ප. යමක වග්ග, 1-2 ගාථා).

තවද අහසෙහි සිටියත් මුහුද මැද සිටියත් පර්වත කුහරයක සිටියත් ලොව කොතැන සිටියත් කර්මයෙන් ලැබෙන විපාකයෙන් නොමිදිය හැකි බව සඳහන් වේ.

*න අන්තලික්ඛෙ න සමුද්දමජ්ඣෙ න පබ්බතානං විවරං පවිස්ස,*
*න විජ්ජති සො ජගතිප්පදෙසෙ යත්ථට්ඨිතං මුඤ්චෙය්‍ය පාපකම්මා.* (ධ.ප., පාප වග්ග, 12 ගා.)

බුදුදහමෙහි සඳහන් බොහෝ ඉගැන්වීම්වලට කර්මය ඇතුළත් ව තිබේ. ඒ අතර පුනර්භවය, පටිච්චසමුප්පාදය, ස්කන්ධ විග්‍රහය, කුසල අකුසල විග්‍රහය, නාම රූප, සතර ආහාර, ආයතන, ආර්ය අෂ්ටාංගික මාර්ගය, චතුරාර්ය සත්‍යය, නිවන ප්‍රධාන ය. පුනර්භවයට හේතුවන ප්‍රතිසන්ධි චිත්තය සමග කර්මය සම්බන්ධ ව පවතී. පටිච්චසමුප්පාදයෙහි සංඛාර නමින් දක්වෙන්නේ කර්මයයි. ඊට අනුව සත්ත්වයා කර්ම සිදුකරන්නේ අවිද්‍යාව නිසයි. පංචඋපාදනස්කන්ධ විග්‍රහයෙහි සංඛාර ස්කන්ධයට කර්මය ඇතුළත් වේ. 'කුසල - අකුසල' සත්ත්වයා විසින් සිදු කරනු ලබන කර්මය දෙකට බෙදා තිබේ. නාම රූප විග්‍රහයෙහි ලා එය නාම යටතට ඇතුළත් වේ. සතර ආහාරයෙහිලා මනො සංචේතනාහාරය යටතට ගැනේ. ආයතන විග්‍රහයෙහි ලා බාහිර ආයතන වන රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ, ධර්ම ඇසුරින් සංචේතනය ක්‍රියාත්මක වේ. ආර්ය අෂ්ටාංගික මාර්ගය වූ කලි කර්මක්ෂය කිරීමේ ආර්ය මාර්ගයයි. එහි සම්මා දිට්ඨියෙහි විශේෂයෙන් කර්මය පිළිබඳව දක්වේ. සම්මාදිට්ඨිය වූ කලි දෙවැදෑරුම් ය. එනම් සාස්‍රව වූ පුණ්‍යාභාගීය සංඛ්‍යාත උපධි සම්පත් ගෙන දෙන කර්මඵල ඇදහීම පිළිබඳ ලෞකික සම්මා දිට්ඨිය හා ආර්ය වූ අනාස්‍රව වූ ලෝකෝත්තර වූ මාර්ගයට අංගයක් වූ චතුසච්ච සම්මා දිට්ඨියයි. මින් පළමුවැන්නෙන් කියැවෙන්නේ කර්මස්සකතා සම්මාදිට්ඨියයි. එනම්, දුන් දෙයෙහි විපාක ඇත, යාගයෙහි විපාක ඇත..., ආදී වශයෙන් දක්වෙන කර්මඵල විශ්වාස කිරීම් වශයෙන් පවත්නා සම්මාදිට්ඨිය මීට අයත් ය.

සත්ත්වයා මිථ්‍යා දෘෂ්ටියෙන් මුදවා සම්මා දිට්ඨියෙහි පිහිටුවාලීම සඳහා බුදුදහම නිබඳව අනුශාසනා කරනු දක්නට ලැබේ. ඒ සඳහා දේශිත අනුශාසනා පෙළ දහමෙහි නිතර හමුවේ. යහපත කරන්නාට යහපත් ප්‍රතිඵල ද, අයහපත කරන්නාට අයහපත් ප්‍රතිඵල ද අත්විඳීමට සිදුවන බව බුදුසමය අවධාරණය කරයි (*කල්‍යාණකාරී කල්‍යාණං - පාපකාරී ච පාපකං*, ඉසයොසමුද්දක සූත්‍රය, සං.නි. I, 404 පිට). වපුරන්නේ යම් බීජයක් ද ඵල වශයෙන් ලැබෙන්නේ ඊට සමාන ඵලයි. එමෙන් ම කරන කර්මයන්ට අනුරූපව ප්‍රතිඵල ලැබේ (*යාදිසං වපතෙ බීජං - තාදිසං හරතෙ ඵලං*). තවද කර්මය නිසා ලෝකය පවත්නා බවත් කර්මය නිසා ප්‍රජාව ජීවත් වන බවත් ගමන් කරන රථයක රෝදය නොගැළවී තබන කඩ ඇණය ලෙසින් සත්ත්වයා කර්මයට බැඳී පවත්නා බව ද සඳහන් වේ.

*කම්මනා වත්තතී ලොකො - කම්මනා වත්තතී පජා,*
*කම්මනිබන්ධනා සත්තා - රථස්සාණීව යායතො.*

(සු.නි. වාසෙට්ඨ සුත්ත, 657 ගාථාව)

මෙබඳු තත්ත්වයක් මත කයින්, වදනින්, සිතින් කර්ම කිරීමේ දී යළි යළිත් නුවණින් විමසා බලා එය සිදු කරන ලෙස පෙළ දහමෙහි නිතර අවධාරණය කර ඇත (අම්බලට්ඨික රාහුලොවාද සුත්ත, ම.නි. II, 132 පිටුව). එහි දී යහපතෙහි යෙදෙන ලෙසත් අයහපතින් මිදෙන ලෙසත් දක්වේ (*අභිත්ථරෙථ කල්‍යාණෙ - පාපා චිත්තං නිවාරයෙ*). දරුවන් හදන දෙමාපියන් විසින් දරුවනට සිදු කළ යුතු යුතුකම් අතර ද පළමුවෙන් ම සඳහන් වන්නේ තම දරුවන් පාපයෙන් මුදවා යහපතෙහි යොදවන ලෙසයි (*පාපා නිවාරෙන්ති, කල්‍යාණෙ නිවෙසෙන්ති*, සිගාල සුත්ත, දී.නි.).

අයහපතින් මිදීම හා යහපතෙහි යෙදීම සඳහා වූ මෙම අනුශාසනාව වූ කලී අප ගෞතම බුදුරදුන්ගේ පමණක් නොව ලොව පහළ වන සියලු බුදුවරුන්ගේ අනුශානාවයි.

> *සබ්බපාපස්ස අකරණං - කුසලස්ස උපසම්පදා,*
> *සචිත්තපරියොදපනං - එතං බුද්ධානසාසනං.* (ධ.ප., බුද්ධවග්ග, 5 ගා.)

යමකු වසලයකු හෝ බ්‍රාහ්මණයකු වීමට බලපාන ප්‍රධාන සාධක වනුයේ ඔහු විසින් කරනු ලබන කර්මයේ ස්වභාවයයි.

> *න ජච්චා වසලො හොති - න ජච්චා හොති බ්‍රාහ්මණො,*
> *කම්මනා වසලො හොති - කම්මනා හොති බ්‍රාහ්මණො.*
>
> (සු.නි., 653 ගා., වසල සුත්ත,)

යමකු පෙර පින් කර ඇති බව (*පුබ්බෙ ච කතපුඤ්ඤතා*, සු.නි. මංගල සුත්ත) දෙලොව අභිවෘද්ධිදයී මංගල කරුණක් ලෙස දක්වේ. මෙබඳු ස්වභාවයෙන් යුතු කර්මයට සුළු වූවකැයි අවමන් නොකරන ලෙස (*මාවමඤ්ඤෙථ පුඤ්ඤස්ස න මං තං ආගමිස්සති*) ද බුදුසමය අවධාරණය කරයි. පාප කර්ම ඉන් මිදී සැඟවිය හැකි තැනක් මිහිපිට කිසිදු තැනක නැති බව සඳහන් වේ (*න විජ්ජති සො ජගතිප්පදෙසො යත්ථට්ඨිතො මුඤ්චෙය්‍ය පාපකම්මා,* ධ.ප. 127 ගාථාව).

## විපාක

❖ විපාකයන්හි ස්වභාවය අනුව කර්මය කොටස් හතරකට බෙදේ. එනම්,

1. *කණ්හං කණ්හවිපාකං*
   කළු විපාක ඇති කළු කර්ම - (සතර අපායන්හි දුක් විඳීමට හේතුවන කර්ම)
2. *සුක්කං සුක්කවිපාකං*
   සුදුවිපාක ඇති සුදු කර්ම - (සදෙව් ලොව, බඹලොව ඉපදීමට හේතුවන කර්ම)
3. *කණ්හසුක්කං කණ්හසුක්කවිපාකං*
   කළු සහ සුදු යන මිශ්‍ර විපාක ජනිතවන කර්ම (මිනිස් ලොව ඉපදීමට හේතුවන කර්ම)
4. *අකණ්හඅසුක්කං අකණ්හඅසුක්කවිපාකං*
   කළු ද නොවූ සුදු ද නොවූ විපාක දෙන කළු ද නොවූ සුදු ද නොවූ කර්ම
   (කර්ම ක්ෂය කොට නිවන සඳහා හේතු වන කර්ම) (පඨමකම්මසුත්ත, අං.නි.2, 446 පිට චතුක්කනිපාත)

❖ විපාක දෙන කාලය අනුව කර්මය කොටස් තුනකට බෙදේ (නිබ්බෙධික සුත්ත, අං.නි.4, 200-210 පිටු). එනම්,

1. දිට්ඨධම්මවේදනීය කම්ම - මෙලොව දී ම විපාක දෙන කර්ම
2. උපපජ්ජවේදනීය කම්ම - දෙවන භවයෙහි දී අනිවාර්යයෙන් විපාක දෙන කර්ම
3. අපරාපරියවේදනීය කම්ම - රහත් භාවය දක්වා කවර භවයක හෝ විපාක දෙන කර්ම

* (අභිධම්මත්ථ සංගහ). අහොසි කර්ම - විපාක විඳීමට අවස්ථාවක් නොලැබ අහෝසි වන කර්ම

- විපාක දෙන ආකාරය අනුව ද කර්මය කොටස් හතරකට බෙදේ. එනම්,

  1. ගරුක කම්ම - දෙවන භවයෙහි අනිවාර්යයෙන් විපාක දෙන බලවත් කර්ම
     (කුසල - ධ්‍යාන, මාර්ගඵල, අකුසල - පංචානන්තරිය කර්ම, නියත මිථ්‍යා දෘෂ්ටිය)
  2. ආසන්න කම්ම - මරණාසන්න මොහොතෙහි සිදු කරන ලද කර්ම
  3. ආචිණ්ණ කම්ම - නිතර පුරුදු පුහුණු කරන ලද කර්ම
  4. කටත්තා කම්ම - කලාතුරකින් / අහම්බෙන් සිදුකරන ලද කර්ම

- කර්මය කෘත්‍ය වශයෙන් සතරාකාර වේ. එනම්,

  1. ජනක කම්ම - ප්‍රතිසන්ධිය ලබා දෙන කර්ම
  2. උපස්ථම්භක කම්ම - ප්‍රතිසන්ධිය ලබා දුන් පසු ඊට උපකාරවත් වන කර්ම
  3. උපපීඩක කම්ම - ප්‍රතිසන්ධිය ලබාදුන් පසු ඊට බාධා කරන / එය දුර්වල කරන කර්ම
  4. උපඝාතක කම්ම - ජනක කර්ම ශක්තිය සහමුලින් ම නැති කරන කර්ම

- කර්මය විපාක දෙන ස්ථාන (භූමි) වශයෙන් සිව්වැදෑරුම් වේ. එනම්,

  1. අපාය භූමි - සිව් අපා - (නරක , තිරිසන්, ප්‍රේත, අසුර)
  2. කමාවචර සුගති භූමි - සදෙව් ලොව
     (චාතුම්මහාරාජිකය, තාවතිංසය, යාමය, තුසිතය, නිම්මානරතිය, පරනිම්මිතවසවත්ති)
  3. රූපාවචර භූමි - රූපාවචර බඹලොව 16
     (බ්‍රහ්මපාරිසජ්ජ, බ්‍රහ්මපුරොහිත, මහාබ්‍රහ්මය, පරිත්තාභ, අප්පමාණාභ, අභස්සර, පරිත්තසුභ, අප්පමාණසුභ, සුභකිණ්ණ, වෙහප්ඵලා, අසඤ්ඤසත්ත, සුද්ධාවාස (අවිහ, අතප්ප, සුදස්ස, සුදස්සී, අකණිට්ඨක)
  4. අරූපාවචර භූමි - අරූපාවචර බඹලොව සතර
     (ආකාසානඤ්චායතනය, විඤ්ඤාණඤ්චායතනය, ආකිඤ්චඤ්ඤායතනය, නෙවසඤ්ඤානාසඤ්ඤායතනය)

- මරණය සිදු විය හැකි ආකාර සතර

  1. අයුක්ඛය - ආයුෂ නිමා වීමෙන් සිදු වන මරණ
  2. කම්මක්ඛය - කර්මය නිමාවීමෙන් සිදු වන මරණ
  3. උභයක්ඛය - ආයුෂ සහ කර්මය එක විට නිමාවීමෙන් සිදු වන මරණ
  4. උපච්ඡේදක - ආයුෂ සහ කර්මය යන දෙක ම තිබිය දී හදිසියේ සිදුවන මරණ

- සතර ප්‍රතිසන්ධි

  1. අපාය ප්‍රතිසන්ධි
  2. කාමසුගති ප්‍රතිසන්ධි
  3. රූපාවචර ප්‍රතිසන්ධි
  4. අරූපාවචර ප්‍රතිසන්ධි

- අකුසල කර්මය යටපත් වන සම්පත්ති සතරකි. එනම්,

  1. ගති සම්පත්ති (උපත)
  2. උපධි සම්පත්ති (රූ සපුව)
  3. කාල සම්පත්ති (කාලය)
  4. පයොග සම්පත්ති (උත්සාහය)

- කුසල කර්මය යටපත් වන විපත්ති සතරකි. එනම්,

  1. ගති විපත්ති
  2. උපධි විපත්ති
  3. කාල විපත්ති
  4. පයොග විපත්ති

## කම්මසරික්කතාව ඃ

කම්මසරික්කතාව යනු කරනු ලබන කර්මයන්ට අනුරූප ව විපාක ලැබේ ය යන්නයි. බුදුදහමෙහි මීට අදාළ ඉගැන්වීම් නිතර දක්නට ලැබේ. ඉහත සඳහන් බොහෝ කරුණු ඊට දෙස් දෙයි. ඊට තවත් උදහරණ කීපයක් මෙසේ දැක්විය හැකි ය.

*අන්නදෙ බලදෙ හොති - වණ්ණදෙ හොති වත්ථදෙ,*
*යානදෙ සුඛදෙ හොති - දීපදෙ හොති චක්ඛුදෙ.*
*සො ච සබ්බදදෙ හොති - යො දදති උපස්සයං,*
*අමතං දදෙ ච සො හොති - යො ධම්මමනුසාසති,* (සං.නි. 1, කිංදද සුත්ත)

(ආහාර දෙන්නේ බලය දෙන්නේ වෙයි. වස්ත්‍ර දෙන්නේ වර්ණය දුන්නා වේ. යාන - වාහන දෙන්නේ සැපය දෙන්නේ වේ. පහන් ආලෝකය දෙන්නේ ඇස් දෙන්නේ වේ. යමෙක් නිවසක් දෙන්නේ ද ඔහු සියල්ල දෙන්නේ වේ. යමෙක් ධර්මයෙන් අනුශාසනා කෙරේ ද ඔහු අමෘතය දෙන්නේ වේ.)

කර්මානුරූප ව සසර උපත සිදුවන ආකාරය ද ධර්මයෙහි පැහැදිලි ව විස්තර වේ.

*ගබ්භමෙකෙ උප්පජ්ජන්ති - නිරයං පාපකම්මිනො,*
*සග්ගං සුගතිනො යන්ති - පරිනිබ්බන්ති අනාසවා.*
(ධ.ප. පාපාවග්ග, 11 ගාථාව)

(ඇතැමෙක් මව්කුසින් උපදින අතර පව් කළ අය නිරයට යති. පින් කළවුන් ස්වර්ගයට යන අතර ආශ්‍රව රහිත වූවෝ පිරිනිවන් පාති.)

තවද පව් කරන්නා මෙලොවත් පරලොවත් තැවෙන බවත් දෙලොව ම තැවෙන බවත් (*පාපකාරී උභයත්ථ තප්පති,* ධ.ප.) සඳහන් වේ. පින් කරන්නා මෙලොවත් පරලොවත් සතුටුවන බවත් දෙලොව ම සතුටු වන බවත් දක්වේ (*කතපුඤ්ඤො උභයත්ථ නන්දති,* ධ.ප.). මෙබඳු ස්වභාවයෙන් යුක්ත කර්ම තුළින් ජනිත වන කර්ම ඵලය ක්ෂණික නොලැබෙන බවත් එය කල් යාමෙන් විපාක ලැබෙන බවත් දක්වා ඇත්තේ මෙසේ ය.

*න හි පාපං කතං කම්මං - සජ්ජු ඛීරං'ව මුච්චති,*
*ඩහං තං බාලමන්වෙති - භස්මච්ඡන්නො'ව පාවකො.* (ධ.ප., බාල වග්ග, 12 ගා.)

(කළා වූ පාප කර්මය දෙනගේ තනය ඇල්ලූ විගස කිරි නික්මෙන්නාක් මෙන් එකෙණෙහි ම විපාක නොදෙයි. එය ඔහු දවමින් ගිනි අඟුරක් මෙන් ඔහු පසුපස ගමන් කරයි.)

තවද අකුසල කර්මයෙහි ඊට වඩා බලවත් වූ විපාක කුසල විපාක මගින් යටපත් කළ හැකි බව දැක්වේ.

*යස්ස පාපං කතං කම්මං - කුසලෙන පිධීයති,*
*සො ඉමං ලොකං පභාසෙති - අබ්භා මුත්තො'ව චන්දිමා.* (ධ.ප., ලෝකවග්ග, 7 ගා.)

(යමකු විසින් කරන ලද පාප කර්මය කුසලයෙන් වසයි ද වළාකුළින් නික්මෙන සඳ මෙන් මෙලොව එළිය කරයි.).

මෙබඳු තත්ත්වයක් මත පිනට කැමැත්තක් ඇති කරගන්නා ලෙසත් (*තම්හි ඡන්දං කයිරාථ,* ධ.ප.) පිනට බිය නොවන ලෙසත් (*මා පුඤ්ඤස්ස භායී, මා පුඤ්ඤස්සභායී සුත්ත,* ඉතිවුත්තක පාළි) ඊට හේතු පින වනාහි සැපතට නමක් වන නිසා (*සුඛො පුඤ්ඤස්ස වුච්චයො*) බවත් දැක්වේ.

කර්මයට විපාක ලැබෙන බව බුදුසමය සඳහන් කළ ද යම් දෙදෙනකු කරන කර්ම සමාන වුව ද ඊට විපාක වශයෙන් ඔවුන් දෙදෙනාට ලැබෙන ඵලය වෙනස් විය හැකි ය. ලෝණඵල සූත්‍රයෙහි මීට නිදසුනක් ඉදිරිපත් වේ. සමාන අකුසල කර්ම කරන පුද්ගලයන් දෙදෙනෙක් සිටිති. ඊට විපාක වශයෙන් එක් අයෙක් අපාගත වෙයි. එසේ වුව ද අනෙක් තැනැත්තා එලෙස අපාගත නොවේ. මීට හේතුව කුමක් දැයි බුදුරදුන් වෙතින් ඇසූ පැනයට උන් වහන්සේගේ පිළිතුර ප්‍රකාශ වූයේ උපමාවකට අනුව ය. සමාන ලුණු කැට දෙකක් ගෙන ඉන් එකක් කුඩා වතුර වීදුරුවකට ද අනෙක් ගඟකට ද දමා දියවෙන්නට ඉඩ සැලසුව හොත් වීදුරුවෙහි ජලය ලුණු රස වන අතර ගඟෙහි වතුරෙහි වෙනසක් නොමැත. වීදුරුවෙහි ජලය ලුණු රස වන්නාක් මෙන්

ඇතැමුන් කරන අකුසල කර්ම තුළින් ජනිත වන විපාක නිසා ඔවුන් අපාගත වන අතර තවත් අය ගඟට දමූ ලුණු කැට තුළින් ගඟෙහි ජලයට වෙනසක් නොවන්නාක් මෙන් අපාගත නොවී සුගතිගාමී වෙති. ඇතැමෙක් දුගතිගාමී වන්නේ ඔවුන් තුළ පවත්නා කුසලය බලවත් නොවීම නිසා ය. තවෙකෙක් එබඳු ම අකුසලයක් කොට ද සුගතිගාමී වන්නේ ඔවුන් තුළ ඊට වඩා බලවත් කුසල ධර්ම පවත්නා හෙයිනි.

## මහාකම්මවිභංග සූත්‍රය

පුද්ගලයා සිදු කරන කුසලාකුසල කර්මයන්ට අනුරූපව විපාක විඳීම පිළිබඳ අනුශාසනා බුදුසමයෙහි නිතර දක්නට ලැබෙන හෙයින් මෙලෙස කම්මසරික්කතාවක් පිළිබඳව පසුකාලීන සාකච්ඡාවට භාජනය විය. එසේ වුව ද මහාකම්මවිභංග සූත්‍රයට අනුව මෙකී අනුපිළිවෙළ වෙනස් වන අවස්ථා ද පවත්නා බව බුදුසමය අවධාරණය කරයි. ඒ අනුව කර්මයට අනුව විපාක දෙන ආකාර සතරකි. එනම්,

1. අකුසල් කොට දුගතිගාමී වීම - *අභබ්බං අභබ්බාසං*
2. අකුසල් කොට සුගතිගාමී වීම - *අභබ්බං භබ්බාසං*
3. කුසල් කොට සුගතිගාමී වීම - *භබ්බං භබ්බාසං*
4. කුසල් කොට දුගතිගාමී වීම - *භබ්බං අභබ්බාසං*

(මහාකම්මවිභංග සුත්ත, ම.නි.III, 444 පිට)

මෙලෙස සිදු වීමට හේතු වන කරුණු එම සූත්‍රයෙහි වැඩිදුරටත් වේ. එබැවින් කම්මසරික්කතාව එලෙස ම සිදු නොවන අවස්ථා ද ඇති බව අප විසින් වටහා ගත යුතුව ඇත. **ඒ අනුව අකුසල් කොට දුගතිගාමී වන අය මෙන් ම අකුසල් කොට සුගතිගාමී වන අය ද ඇති බව බුදුදහමින් පෙන්වා දී තිබේ. එසේ වන්නේ අකුසල් නිසා නොව ඔවුන් විසින් ඊට වඩා ප්‍රබල කුසල දහම් තම ජීවිතයේ අවසාන සමයේ දී හෝ සිදු කර ගන්නා බැවිනි. තව ද කුසල් කොට සුගතිගාමී වන අය මෙන් ම කුසල් කොට දුගතිගාමී වන අය ද සිටින බව අප විසින් අමතක නොකළ යුත්තකි. එසේ වන්නේ තමා විසින් සිදු කරන ලද කුසල හේතුවෙන් නොව ඒ කුසලකර්ම මැඩලන අකුසල කර්ම මරණාසන්න වන විට තමා අතින් සිදුවීම හේතුවෙනි.** මෙලෙස කර්මය පිළිබඳ බුදුරජාණන් වහන්සේ තුළ පැවැති පුළුල් දැනුම පිළිබඳව අප දැනුවත් වුවහොත් යමකුගේ ක්‍රියා කලාපය දෙස මතුපිටින් පමණක් බලා ඔහු මරණින් පසු උපදින ලෝකය පිළිබඳ නිගමන දීමට අප ඉක්මන් නොවනු ඇත.

බුදුදහමට අනුව කළු (පාප = අකුසල) කර්ම හා සුදු (පුණ්‍ය = කුසල) කර්ම වශයෙන් කර්මය ප්‍රධාන ප්‍රභේද දෙකකට බෙදේ. එනම් සිත අපිරිසිදුව කරන කර්ම හා සිදු පිරිසිදුව කරන කර්ම වශයෙනි. අපිරිසිදු සිතින් කරන කායික, වාචසික, මානසික ක්‍රියාවන්ට විපාක වශයෙන් දුක තමා පිටුපස ලුහුබඳියි. ගොනා පිටුපස එන කරත්තය මෙන් මහත් වූ බරක් තමා වෙත පැමිණෙයි. පිරිසිදු සිතින් කරන කායික, වාචසික, මානසික ක්‍රියාවන්ට ආනිසංස වශයෙන් සෙවණැල්ලක් හා සමානව තමා පිටුපස යහපත ගමන් කරයි. එය මෙලොවදීත් පරලොවදීත් තමාට උපකාරවත් වෙයි. ධර්මශ්‍රවණය කිරීමෙන් කර්මය පිළිබඳ මෙම අවබෝධය ලද දහම පිළිබඳ විශ්වාසය ඇති කරගත් තැනැත්තා හැකිතාක් දුරට සිත පිරිසිදුව පවත්වා ගැනිමින් කටයුතු කිරීමට උත්සාහවත් වෙයි.

## මංගල සූත්‍රය

අඛණ්ඩව ධර්මශ්‍රවණයෙහි නිරත වෙමින් නිතර සිත පිරිසිදුව පවත්වා ගැනීමේ ප්‍රතිඵල වශයෙන් තම ජීවිතයෙන් බොහෝ යහපත් දෑ නිරායාසයෙන් ම සිදුවෙයි. මංගල සූත්‍රයෙහි දැක්වෙන්නේ එබඳු යහපත් ක්‍රියාවන් ය.

*අසේවනා ච බාලානං* - අනුවණ අය ඇසුරු නොකිරීම
*පණ්ඩිතානං ච සේවනං* - නුවණැති අය ඇසුරු කිරීම
*පූජා ච පූජනීයානං* - පිදිය යුත්තන් පිදීම
*පතිරූපදේසවාසො ච* - සුදුසු පෙදෙසක වාසය කිරීම
*පුබ්බෙ ච කතපුඤ්ඤතා* - පෙරපින් ඇති බව

*අත්තසම්මා පණිධි ච* - තමසිත පිරිසිදු කර ගැනීම
*බාහුසච්චං ච* - බොහෝ ශාස්ත්‍ර උගත්බව
*සිප්පං ච* - ශිල්ප උගත්බව
*විනයො ච* - විනයවත්බව
*සුසික්ඛිතො* - මැනැවින් හික්මුණු බව
*සුභාසිතා ච යා වාචා* - යහපත් වචන ඇතිබව
*මාතාපිතුඋපට්ඨානං* - මව්පියන්ට උපස්ථාන කිරීම
*පුත්තදරස්ස සංගහො* - අඹුදරුවන්ට සංග්‍රහ කිරීම
*අනාකුලා ච කම්මන්තා* - නිරවුල් කර්මාන්ත ඇති බව
*දනං ච* - දන්දීම
*ධම්මචරියා ච* - ධර්මානුකූල හැසිරීම
*ඤාතකානඤ්ච සංගහො* - ඤාතීන්ට සංග්‍රහ කිරීම
*අනවජ්ජානි කම්මානි* - නිවැරදි කර්මාන්ත
*ආරති විරති පාපා* - පාපයන්ගෙන් වෙන්වීම
*මජ්ජපානා ච සඤ්ඤමො* - මත්පැන්හි හික්මීම
*අප්පමාදෙ ච ධම්මෙසු* - ධර්මයෙහි නොපමාවීම
*ගාරවො ච* - ගරුකළ යුත්තන්ට ගරු කිරීම
*නිවාතො ච* - නිහතමානී බව
*සන්තුට්ඨී ච* - ලද දෙයින් සතුටුවීම
*කතඤ්ඤුතා* - කළගුණ දන්නා බව
*කාලෙන ධම්මසවණං* - සුදුසු කල්හි ධර්මශ්‍රවණය
*ඛන්ති ච* - ඉවසීම
*සොවචස්සතා* - ඇහුන්කම්දීම
*සමණානඤ්ච දස්සනං* - ශ්‍රමණයන් වහන්සේලා දැකීම
*කාලෙන ධම්මසාකච්ඡා* - සුදුසු කල්හි ධර්ම සාකච්ඡාව
*තපො ච* - සිල්වත්බව
*බ්‍රහ්මචරියඤ්ච* - බඹසර හැසිරීම
*අරියසච්චානදස්සනං* - ආර්ය සත්‍යය දැකීම
*නිබ්බාණසච්ඡිකිරියා ච* - නිර්වාණය සාක්ෂාත් කිරීම
*පුට්ඨස්ස ලොකධම්මෙහි චිත්තං යස්ස න කම්පති* - අටලෝ දහම අබියස කම්පා නොවීම
*අසොකං* - ශෝක නොකිරීම
*විරජං* - කෙළෙස් මල දුරලීම
*ඛේමං* - නිවීමට පත්වීම (මංගල සුත්ත, ඛු.නි.,1, ඛු.පා.)

සිත පිරිසිදු වූ පමණට ඉහත මංගල කරුණු වැඩිපුර නිතිපතා සිදු වෙයි. යමෙකුගේ ජීවිතයෙන් මෙම මංගල කරුණු සිදු වූ පමණට ඔහුගේ ජීවිතයේ සතුට සැනසුම සහනය උදාවේ. එබැවින් මෙම කරුණු උතුම් මංගල කරුණු වශයෙන් භාග්‍යවතුන් වහන්සේ පෙන්වා දුන්හ.

## සුමනා සූත්‍රය

දිනක් බුදුරදුන් වෙත පැමිණි සුමනා දේවිය දනය පිළිබඳව බුදුරදුන් වෙතින් අසා සිටියා ය. එහිදී ඇය විමසා සිටියේ කිසියම් දෙදෙනෙක් ශ්‍රද්ධාව, ශීලය හා ප්‍රඥාව යන කරුණුවලින් සමානව එහෙත් දන් දීමෙන් වෙනස් ව සිටින විට ඒ දෙදෙනාගේ සසර ජීවිතයෙහි කිසියම් වෙනසක් ඇත් ද කියායි (... *ද්වේ සාවකා සමසද්ධා සමසීලා සමපඤ්ඤා, ඒකෝ දයකෝ ඒකෝ අදයකෝ*). මෙහි දී බුදුරදුන් සඳහන් කළේ නිවන් දැකීම දක්වා ම දන් දුන් තැනැත්තාට ඉන් වඩාත් ආනිසංස සැලසෙන බවයි. ශ්‍රද්ධාව, ශීලය හා ප්‍රඥාවට අමතරව දනය ප්‍රගුණ කළ තැනැත්තා දෙව් ලොව ඉපදුණ ද මිනිස් ලොව ඉපදුණ ද ආයුෂ, වර්ණ, සැප, අධිපති යනාදි

කරුණුවලින් වඩාත් උසස් මට්ටමක පසුවන බව භාග්‍යවතුන් වහන්සේ සඳහන් කළහ. එපමණක් නොව දානය ප්‍රගුණ කළ තැනැත්තා පැවිදි වූ කල්හි අන් අයට වඩා සිව්පසය ලබන බව ද දේශනා කළහ. මේ සියලු ආනිසංස නිවන දක්වා ම බාහිර සාධක වශයෙන් උපකාරවත් වේ. බුදුරදුන්ගේ මෙම විග්‍රහයට බෙහෙවින් ප්‍රසාදය පල කළ සුමනා දේවිය වඩ වඩාත් දානය ම ප්‍රගුණ කළ යුතු ය (*අලමේව දානානි දාතුං අලමේව පුඤ්ඤානි කාතුං...*) යන උදානය පවසමින් නික්ම ගියා ය (සුමනා සුත්ත, අං.නි.3, 50-52 පිටු).

## ව්‍යග්ඝපජ්ජ සූත්‍රය

දිනක් බුදුරදුන් වෙත පැමිණ ව්‍යග්ඝපජ්ජ නම් දීඝජාණුකෝලිය පුත්‍රයා බුදුරදුන් වෙතින් ධර්ම කරුණක් විමසා සිටියේ ය. තමා බඳු ගිහිවත් දරන කාමභෝගී ගෘහස්ථ ජීවිත ගත කරන්නෙකුට මෙලොව ජීවිතයේ සාර්ථකත්වයට හේතුවන හා පරලොව ජීවිතයේ යහපතට හේතුවන කරුණු දේශනා කරන ලෙසයි. එහි දී භාග්‍යවතුන් වහන්සේ මෙලොව ජීවිතය සඵල වීමට හේතුවන කරුණු වශයෙන් දේශනා කළේ,

1. *උට්ඨාන සම්පද* - උත්සාහයෙන් මහන්සියෙන් අධ්‍යාපන හා වෘත්තීය කටයුතුවල නියැළීම
2. *ආරක්ඛ සම්පද* - තමා ඉපැයූ ධනය ආරක්ෂා කිරීම
3. *කල්‍යාණ මිත්තතා* - ගුණ නුවණින් සපිරි කලණ මිතුරන්ගේ ඇසුර
4. *සමජීවිකතා* - තමාගේ ආදායමට සරිලන සේ වියදම් කිරීම (ව්‍යග්ඝපජ්ජ සුත්ත, අ.නි.5, 236 පිට)

ඉහත කරුණුවලින් මෙලොව ජීවිතය සාර්ථක කර ගත් පමණට සමාජගත ජීවිතයෙහි දී ගෞරවාන්විතව නිර්භයව ජීවත් වීමට අවස්ථාව උදාවේ. එවිට ආධ්‍යාත්මික දියුණුව ඇති කර ගැනීම ද පහසු වනු ඇත.

පරලොව ජීවිතයේ යහපත සඳහා හේතුවන කරුණු වශයෙන් බුදුරජාණන් වහන්සේ මෙහිදී දේශනා කළේ,

1. *සද්ධා සම්පද* - බුද්ධ, ධම්ම, සංඝ යන තෙරුවන වෙත ඇති ප්‍රසාදය හා විශ්වාසය
2. *සීල සම්පද* - කායික - වාචසික සංවරය
3. *චාග සම්පද* - පරිත්‍යාගශීලීත්වය
4. *පඤ්ඤා සම්පද* - උදයබ්බයගාමිනී පඤ්ඤා - ස්කන්ධාදි ධර්මයන්හි හටගැනීම් නිරුද්ධවීම් දකින නුවණ (ව්‍යග්ඝපජ්ජ සුත්ත, අ.නි.5, 240 පිට)

මෙම කරුණු පරලොව සුගතියට පත්ව ජීවිතය සාර්ථක කර ගැනීමට මෙන් ම නිවන සඳහා ද උපකාරවත් වේ. තම ආධ්‍යාත්මික ශක්තිය දියුණු කොට සියලු දුක්වලින් නිදහස්වීමට ඉහත කරුණු සෘජුව ම උපකාරවත් වේ.

'ඵලූපජීවී පුග්ගල සූත්‍රයට' (අ.නි. 2, 260 පිට) අනුව සත්ත්වයා ජීවත් වන හේතු හතරක් දැක්වේ. එනම්,

1. *කම්මඵලූපජීවී* - කර්ම විපාක නිසා ම ජීවත් වන්නෝ
2. *උට්ඨානඵලූපජීවී* - වීර්යය නිසා ම ජීවත් වන්නෝ
3. *කම්මඋට්ඨානඵලූපජීවී* - කර්මය ද වීර්යය ද නිසා ජීවත් වන්නෝ
4. *නෙවකම්ම න උට්ඨානඵලූපජීවී* - කර්මයවත් වීර්යයවත් නැති ව ජීවත් වන්නෝ

කම්මනිදාන සූත්‍රයට අනුව කර්මක්ෂය කිරීම සම්බන්ධ ව සඳහන් වේ. 'ලෝභ, දෝස, මෝහ චේතනා මුල් වී හටගන්නා කර්ම අකුසල නම් වේ. එම කර්ම සාවද්‍යයි, ඒ කර්මවලට දුක් විපාක විඳීමට සිදු වේ. මෙම කර්ම 'කර්මසමුදය' (හටගැනීම) පිණිස පවතී. මේ කර්මයන් කර්ම නිරෝධය පිණිස හේතු නොවේ.' 'අලෝභ, අදෝස, අමෝහ චේතනා මුල් වී හටගන්නා කර්ම කුසලයි. ඒ කර්ම නිරවද්‍යයි වන අතර සැප විපාක ගෙන දේ. එම කර්ම 'කර්මනිරෝධය' පිණිස හේතු වේ. ඒ කර්මයන් **කර්ම සමුදය පිණිස** හේතු නොවේ.'

මෙම සූත්‍රයෙන් ප්‍රකට වන ප්‍රධාන අදහස නම් යළි කර්ම හට ගැනීමට හේතු වන කර්ම (*අභිසංකරණ සංඛාර*) මෙන් ම යළි කර්ම හටනොගැනීමට ද හේතු වන කර්ම (*පයෝගාභිසංඛාර*) පවත්නා බවයි. බුදුසමයෙන් විශේෂයෙන් අවධාරණය කෙරෙන්නේ කර්මක්ෂය කිරීම් සංඛ්‍යාත කර්ම සඳහායි. එනම් නිවන සඳහා හේතු වන කුසල කර්ම කිරීමට මග පෙන්වීමයි. මෙය බුදුදහමට පමණක් සුවිශේෂී වූ ඉගැන්වීමකි. යොනිසොමනසිකාරය අනුව නාමරූප ධර්ම පිළිබඳව නුවණින් විමසා බලා නිවැරදි කුසල ක්‍රියාවන්හි යෙදීමේ හැකියාව මිනිසා සතුව පවතී. චේතනාත්මක ව ක්‍රියා කිරීමේ හැකියාව පුද්ගලයා සතු ව පවත්නා බව බුදුරජාණන් වහන්සේ අවධාරණය කරන හෙයින් උන් වහන්සේ කර්මවාදී හා ක්‍රියාවාදී බව සඳහන් වේ (*සමණො ඛලු භො ගොතමො කම්මවාදී කිරියවාදී,* ම.නි.II)

## සසර

බාහිර ලෝකයක් ඇත ය යන හැඟීමෙන් යුතුව අකුසල් සිදු කළ ද කුසල් සිදු කළ ද අප ජීවත් වන්නේ සංසාර චක්‍රය තුළ ම යි. ඊට හේතුව එම කර්ම අවිද්‍යා පාදකව (*අවිජ්ජා පච්චයා සංඛාරා*) සිදුවීම නිසයි. අවිද්‍යාව මුල් වී පුඤ්ඤාභිසංඛාර සිදු කළ ද අපුඤ්ඤාභි (පාප) සිදු කළ ද ආනෙඤ්ජාභිසංඛාර (අරූප ලෝකයෙහි ඉපදීමට හේතුවන කර්ම) සිදු කළ ද සත්ත්වයාට සසර කතරින් මිදීමක් නොමැත. අප සිදු කරන පාප කර්ම කළු කර්ම (*කණ්හං කණ්හවිපාකං*) වන අතර ඒවා කළු හෙවත් දුක් විපාක ගෙන දීමට හේතුවෙයි. අප සිදු කරන පුණ්‍ය හෙවත් කුසල කර්ම (*සුක්කං සුක්කවිපාකං*) වන අතර ඒවා සැප ආනිසංස ගෙන දෙන සුදු කර්ම වශයෙන් දක්වා තිබේ. වරෙක අකුසලය ද තවත් වරෙක කුසලය ද මුල් වී සිදු කරන කර්ම අකුසල හා කුසල යන විපාක දෙක ම විඳීමට සිදුවන කළු-සුදු කර්ම වශයෙන් දක්වා තිබේ. මෙකී කර්මයන්ට අනුව සසරෙහි සැප හෝ දුක් විපාක ලැබුණ ද සසරින් මිදීමක් නොමැත. සුදු කර්ම සිදු කොට වරෙක සුගතිගාමී වුව ද තවත් වරෙක දුගතිගාමී වීමට ද සිදු වේ. තව ද ජරා, මරණ, ජාති ආදි දුක්වලින් මිදීමක් ද නොමැත. බුදුදහමෙහි දැක්වෙන පරිදි මෙම කර්ම තුන ම සිදු කරනු ලබන්නේ අවිද්‍යා පාදකවයි. එනම් තමා වටා නිත්‍ය සැප ආත්ම වූ ලෝකයක් ඇත යන හැඟීමෙන් සිදු කරන කර්ම බැවිනි.

## සසරින් මිදීම

බුදුදහමින් අපව දිරිමත් කරන්නේ කර්මක්ෂය කිරීමට හේතුවන කර්ම හෙවත් කළුත් නොවන සුදුත් නොවන (*අකණ්හ අසුක්කං අකණ්හ අසුක්කවිපාකං*) කර්ම සිදු කරන ලෙසයි. ඒවා පයෝගාභිසංඛාර වශයෙන් දක්වා තිබේ. ඒ සඳහා පටිච්ච සමුප්පාද පාදක චතුසච්ච සම්මාදිට්ඨියෙන් යුතුව සීල, සමාධි, පඤ්ඤා යන ත්‍රිවිධ ශික්ෂා සම්පූර්ණ කළ යුතුව පවතී. මෙහි දී විශේෂයෙන් ස්කන්ධ, ධාතු, ආයතන, නාමරූප ධර්ම අනිත්‍යාදි වශයෙන් යළි යළිත් නුවණින් මෙනෙහි කිරීම අවශ්‍ය කෙරේ.

නිබ්බේධික සූත්‍රයෙහි (අං.නි.4, 200-210 පිටු) කර්මය පිළිබඳ විධිමත් විස්තරයක් ඇතුළත් වේ. ඊට අනුව කර්මය තේමා කොට ප්‍රශ්න හයක් මතුකොට ඊට පිළිතුරු සැපයේ.

1. **කර්මය** දත යුතුයි (*කම්මං භික්ඛවේ වේදිතබ්බං*) මෙහිදී කර්මය යනුවෙන් දැක්වෙන්නේ සංචේතනාවයි (*චේතනාහං භික්ඛවේ කම්මං වදමි. චේතයිත්වා කම්මං කරොති කායේන වාචාය මනසා*). සිතින් සිතා කයින් සිතින් වචනයෙන් මනසින් කර්ම සිදු කරයි.
2. කර්මයේ **නිදානය** දත යුතුයි (*කම්මානං නිදාන සම්භවෝ වේදිතබ්බෝ*). කර්මයේ නිදානය වශයෙන් සඳහන් වන්නේ ස්පර්ශයයි (*ඵස්සො භික්ඛවෙ කම්මානං නිදාන සම්භවො*).
3. කර්මයන්නේ **විවිධත්වය** දත යුතු යි (*කම්මානං වේමත්තතා වේදිතබ්බා*). නිරයේ දුක් විඳීමට හේතුවන කර්ම පවතී. තිරිසන් යෝනියෙහි, ප්‍රේත විෂයයෙහි, මනුෂ්‍ය ලෝකයෙහි, දෙව්ලොව විපාක විඳීමට හේතුවන කර්ම පවතී.
4. කර්මයන්ගේ **විපාක** දත යුතුයි (*කම්මානං විපාකෝ වේදිතබ්බෝ*). කර්මයන්ගේ විපාක තෙවැදෑරුම් වේ. දිට්ඨධම්ම, උපපජ්ජ, අපරාපරිය වශයෙනි.
5. කර්මයේ **නිරෝධය** දත යුතුයි (*කම්මානං නිරෝධෝ වේදිතබ්බෝ*). ස්පර්ශ නිරෝධයෙන් කර්ම නිරෝධය සිදු වේ (*ඵස්සනිරොධො භික්ඛවෙ කම්මානං නිරොධො*).

6. කර්මය නිරෝධ කරන මාවත දත යුතුයි (*කම්මනිරෝධගාමිනී පටිපදා වේදිතබ්බෝ*). කර්මය නිරෝධ කරන මාර්ගය ලෙස පෙන්නුම් කර ඇත්තේ ආර්ය අෂ්ටාංගික මාර්ගයයි (*අයමෙව අරියො අට්ඨංගිකො මග්ගො කම්මනිරොධගාමිනීපටිපදා*)

කර්මය සම්බන්ධයෙන් නිබ්බේධික සූත්‍රයෙහි දැක්වෙන ඉහත සඳහන් ප්‍රභේද හය දැනගෙන සිටීම අතිශය වැදගත් ය. කර්මය පිළිබඳ භාග්‍යවතුන් වහන්සේගේ අනාවරණය එමගින් මැනැවින් ප්‍රකට වේ. කර්මය පිළිබඳ පරිපූර්ණ අවබෝධයක් ලැබීමටත් ධර්ම චක්‍රය භාවිත කොට කර්ම චක්‍රයෙන් නිදහස්වීමටත් මෙය බෙහෙවින් ප්‍රයෝජනවත් වේ.

කර්මයන්ට අනුරූප ව විපාක ලැබීමක් දක්නට ලැබුණ ද බුදුසමයට අනුව කර්මය කරන්නෙක් හෝ එහි ඵල විඳින්නෙක් හෝ නොමැත. හුදෙක් පවත්නේ ශුද්ධ ධර්ම පමණි.

*කම්මස්සකාරකො නත්ථි - විපාකස්ස ච වේදකො,*
*සුද්ධධම්මා පවත්තන්ති - එවෙතං සම්මදස්සනං.*

සත්ත්වයා කර්මය දයාද කොට කර්මය ස්වකීය කොට ඇත්තේ නමුදු කර්ම චක්‍රයට ම නතු වී එහි වහලෙකු සේ හිර කොට තැබීමට බුදුසමය උත්සාහ නොකරයි. කර්මය අභිබවා ගොස් කර්මක්ෂය කිරීමේ මාර්ගය බුදුසමයෙහි පැහැදිලි ව දේශනා කොට ඇත. බුදුදහමේ මූලික ඉලක්කය කර්මක්ෂය කොට සත්ත්වයා සසර දුකින් නිදහස් කරවීමයි. සත්වයාට විමුක්තිය ලද හැක්කේ කර්ම බන්ධනයෙන් නිදහස් වීමෙනි. බෝසතුන් මෙලොව උපත ලද මොහොතෙහි 'මේ මාගේ අවසන් ජාතිය බවත් නැවත භවයක් නැති බවත්' (*අයමන්තිමා ජාති නත්ථි'දානි පුනබ්භවො*) ප්‍රකාශ කළේ මෙකී කර්මක්ෂය කිරීම අරභයා ය.

ඒ සඳහා විවේකනිස්සිත ව විරාගනිස්සිත ව නිරොධනිස්සිත ව නිවනට බර ව සත්ත බොජ්ඣංග ධර්ම වඩා තෘෂ්ණාව ක්ෂය කළ යුතු ව පවතී. තෘෂ්ණාව ප්‍රහීණ වීමෙන් කර්මක්ෂය වන අතර කර්මක්ෂය වීමෙන් දුක් ප්‍රහීණ වේ. තෘෂ්ණාව ක්ෂය කිරීමෙන් දුඃඛක්ෂය වන අතර දුඃඛක්ෂය කිරීමෙන් කර්මක්ෂය වන බව බය සූත්‍රයෙහි දැක්වේ (*තණ්හාය පහානා කම්මං පහීයති. කම්මස්ස පහානා දුක්ඛං පහීයති. ..... තණ්හක්ඛයා කම්මක්ඛයො. කම්මක්ඛයා දුක්ඛක්ඛයොති*, සං.නි. V (1), 176 පිට). මෙලෙස තෘෂ්ණාව දුරු කිරීමෙන් කර්මක්ෂය කළ යුතු බව බුදුසමයෙහි අනුශාසනාවයි. මේ සඳහා වැඩිය යුතු ප්‍රධාන ප්‍රතිපදව ලෙස බුදුදහමින් දැක්වෙන්නේ සතර සතිපට්ඨානයයි.

අවිජ්ජා සූත්‍රයට අනුව සතර සතිපට්ඨානය නිසි ලෙස වැඩෙන්නේ ත්‍රිවිධ සුචරිතය ඇති විටයි. ත්‍රිවිධ සුචරිත සම්පූර්ණ වීමට ඉන්ද්‍රිය සංවරයත් ඉන්ද්‍රිය සංවරය සඳහා සතිසම්පජඤ්ඤයත් සතිසම්පජඤ්ඤය සඳහා යෝනිසො මනසිකාරයත් යෝනිසො මනසිකාරය සඳහා ශ්‍රද්ධාවත් ශ්‍රද්ධාව සඳහා සද්ධර්මශ්‍රවණයත් සද්ධර්මශ්‍රවණය සඳහා කල්‍යාණමිත්‍ර ආශ්‍රයත් අවශ්‍ය කෙරේ. කල්‍යාණමිත්‍ර ආශ්‍රය ඇති විට සද්ධර්මශ්‍රවණය ලැබී එයින් ශ්‍රද්ධාවත් ශ්‍රද්ධාවෙන් යොනිසො මනසිකාරයත් යොනිසො මනසිකාරයෙන් සතිසම්පජඤ්ඤයත් සතිසම්පජඤ්ඤයෙන් ඉන්ද්‍රිය සංවරයත් ඉන්ද්‍රිය සංවරයෙන් ත්‍රිවිධ සුචරිතයත් ත්‍රිවිධ සුචරිතයෙන් සතර සතිපට්ඨානයත් සතර සතිපට්ඨානයෙන් සත්ත බොජ්ඣංගත් පරිපූර්ණත්වයට පත් ව විද්‍යාවිමුක්තිය සාක්ෂාත් වේ. මෙලෙස විද්‍යාවිමුක්තිය නිෂ්ටාව කොට ඇති සම්බුදු දහම් මගෙහි සියලු ගුණරුවන්හි ප්‍රධාන සාධකය වන්නේ කල්‍යාණමිත්‍ර ආශ්‍රයයි. හුදෙක් කල්‍යාණ මිත්‍රයන් සිටීම පමණක් ප්‍රමාණවත් නොවන අතර කල්‍යාණමිත්‍රයන් හඳුනා ගැනීමටත් ඔවුන්ගේ ගුණයට ගරුකිරීමටත් ඔවුන් වෙතින් තම දිවිමගට ආලෝකයක් වූ සද්ධර්ම ප්‍රතිලාභය ළඟා කර ගැනීමටත් අප දක්ෂ විය යුතු ය. බුද්ධිමත් විය යුතු ය. අනතිමානී විය යුතු ය. කෙටියෙන් කිවහොත් (කරණීය) මෙත්ත සූත්‍රයෙහි ඇති ගුණාංගන්ගෙන් සමන්විත විය යුතු ය. මෙකී සියලු ගුණ දහම්හි උසස් ම ප්‍රතිඵලය වන්නේ ප්‍රඥව දියුණු වී දුකින් නිදහස්වීමයි. එහි දී රූප, වේදනා, සඤ්ඤා, සංඛාර, විඤ්ඤාණ යන ස්කන්ධ පංචකය ක්ෂණිකව හටගෙන ඉතිරි නැතිව නිරුද්ධ වන බව මැනැවින් ප්‍රකට වේ. ඒ අතර ධාතු, ආයතන, ඉන්ද්‍රිය, නාමරූප ආදී නම්වලින් සඳහන් වන ජීවිතයේ පැවැත්ම විස්තර කෙරෙන සෙසු ධර්මයන්හි ද පවත්නා අනිත්‍ය, දුක්ඛ, අනාත්ම යන ත්‍රිලක්ෂණය මැනැවින් ප්‍රත්‍යක්ෂ වේ. මෙම අවබෝධය ලබනු වස් අප්‍රමාදී ව ක්‍රියා කිරීම ක්ෂණ සම්පත්තිය ලද බුද්ධිමත් සැමගේ ප්‍රධාන ජීවිත ඉලක්කය විය යුතු ය. භාග්‍යවතුන් වහන්සේගේ අවසාන අවවාදය වූයේ ද අප්‍රමාදීව සතිපට්ඨානය තුළ හැසිරෙන ලෙසයි (*හන්දදානි භික්ඛවෙ ආමන්තයාමි වො වයධම්මා සංඛාරා අප්පමාදෙන සම්පාදථෙ*).

# Action, its Consequence, Existance and Liberation
## (*Kamma, Vipāka, Samsāra and Vimutti*)

As the result of listening to the Buddha's message with the noble association, the very first thing that a disciple understands is the effect of the Karmic force (actions). Every volitional action has a reaction. Understanding the Karmic force is the first step of wisdom that Buddhism points out on the path of happiness. Karma or action, that Buddhism explains, means whatever we do physically, verbally or mentally with volition. Karma, action which consists of volition always relates to its result (*Vipāka*). Every action which is related to the mind with volitions has a reaction. Every volitional action generates results in this life or in a future life. Whatever seeds we sow, we will have to reap the same type of crops. Karma theory is also of this nature. Whatever we do with volitions in the present, its result (*Vipāka*) will come to us in the future. In this situation if we are clever to live in this moment with a pure mind, we can see the fruitful results in the next moment. That is why Buddhism advises us to keep our mind always pure, calm and quiet with generosity, loving kindness, compassion and wisdom.

There are four unconjecturable subjects in Buddhism. They are Jhana (Iddhi), Buddha, World and Kamma. They can't be understood fully. To whoever conjectures about those four subjects to the end would bring madness & vexation. However, the Buddha kindly advised us to reflect on Karma and its results always as a man or a woman, lay person or monk for the wellbeing of people and for understanding life.

**'I am the owner of my actions (Kamma), the inheritor, the origin, the relation and refuge of actions. Whatever actions I perform whether good or evil, I will be their inheritor. This must be reflected upon again and again by one who has gone forth.'**

As much as we listen to what the Buddha taught, our wisdom gradually increases. The very first level of wisdom in Buddhism is the understanding of the Karmic Law (*Kammassakatā Sammāditthi*). Here we are knowledgeable about the actions, volitions and their results. Whatever we do with intention, we will receive the same results. If someone does something physically, verbally or mentally, he or she receives the same results. If someone does something with an impure mind, he will receive the evil results because of his polluted mind. Also, if someone does something with pure mind, he will receive the fruitful results. This is an eternal law which no one controls.

Birth of beings is determined according to Karmic energy. It says in the Dhammapada;

*Gabbhameke uppajjanti nirayaṃ pāpakammino,*
*Saggaṃ sugatino yanti parinibbanti anāsavā.* (Dhammapada-Pāpavagga)

Some are born in the womb; the wicked are born in hell; the well-conducted go to blissful states; the stainless (undefiled ones) pass into Nibbana.

Buddhism points out the path how to overcome suffering and achieve ultimate happiness that no one can change. For real happiness we have to understand the three defilements which disturb our peace of mind. They are greed, anger and ignorance. Our real happiness as well as success depends on how far we have overcome these three defilements (negative thoughts) from our mind and how far we have developed positive thoughts like generosity, loving kindness and wisdom.

Karmic results come to us according to the nature of the action. Some results of Karma come in this life, and some come in future lives according to its strength. This is a process of mind and body as well as a universal law. It occurs as a cause and effect theory. It is not god's will or any other power. It is not even the Buddha's creation. It is only a discovery by the Budddha's wisdom. Buddhism points out very clearly whether a Buddha appeared or not, this reality is forever in the world. If we are wise, we are clever to get the benefits by practicing Karmic theory in the correct way wisely. Here, knowing the Buddha's message of Karma is very important for our correct understanding.

One day a young person, Subha came to the Buddha and asked some questions. "There is so much diversity in the world. Some are unwise, some are wise, some are poor, some are rich, some are beautiful, some are ugly, some live long, some die early, some are in high cast, some are in low cast, some are healthy, some are unhealthy. Lord Buddha, what is the reason for these variations?" Here the Buddha said that the reason for this difference is Karma, and Karma divides people as high and low. The Buddha has explained here how Karma affects our life, and how important it is.

According to Buddhism, understanding the karmic law (*Kammassakatā Sammāditthi*) is very important in the path of liberation. When we do something with a wicked mind, we will reap the bad results. Similarly, if we do something with a pure mind, we will reap fruitful (good) results. If someone has this understanding, he or she always tries to avoid bad deeds and tries to do good as much as he or she can. We avoid bad deeds and do good deeds not only for the success of next birth but also for this life itself. With the understanding of Karmic law, we begin to know the main reason which propels (forces) our entire life.

The Buddha explained two paths; the heavenly path and the path of liberation. First of all, the Buddha emphasized the importance of practicing good (or merits) that assures heavenly rebirths. The big challenge in front of us is the possibility of going to hell after death. Therefore the Buddha kindly pointed out how to avoid hell. We have to try not to do evil and do good to get rid of hell. Why do we abstain from doing evil? Evil is a synonym for suffering. By doing evil we create suffering in our life. It disturbs our success. That is why we should try to overcome evil. Also, while doing good, we generate positive thoughts which brings happiness and success in our life. Practicing merit means generating happiness.

If we wish others discomfort and evil, as the results of these negative thoughts, same evil and discomfort come to us. On the other hand, when we always wish others' success and comfort, and develop benevolence to others, the same results come to our life bringing happiness.

Although we see the results throughout our life according to karmic energy, it doesn't mean that we have a permanent soul or an everlasting mind. Buddhism explains that the Karma theory is also subject to impermanence. Our mind which controls our physical body always changes too. It has no permanent existence. Every thought arises and ceases at the moment according to the conditions. When conditions are together, a thought arises. Also, when those conditions cease, the thought also ceases. The especial thing is that the mind or a thought doesn't arise alone. If a thought arises, other four things are with it. If we have any experience through our senses, five aggregates arise together. Five aggregates are forms (*Rupa* -රූප), feelings (*Vedanā*-වේදනා), perception (*Saññā*-සඤ්ඤා), mental formations (Sankhāra-සංඛාර) and mind (*Viññāna*-විඤ්ඤාණ). These five aggregates arise together at the moment when the conditions are together, and they cease instantly when the conditions separate. These five things appear behind any kind of experiences in our life, but they are invisible, and have to be known with insight.

The nature of these five aggregates is arising and ceasing. At the moment of ceasing, everything ceases without leaving anything remaining. The most valuable and interesting explanation in Buddhism is impermanence. It is said in Buddhism; Not being occurred (in the past) comes to an occurrence. Being occurred (at the present) will not come to (the future) occurrence. (Ahutvā sambhutam hutvā na bhavissati). This is the nature of impermanence that Buddhism explains. Suffering arises because of the delusion that we think our experience was there before we experienced it, and also it remains after the experience. If we are able to overcome this ignorance reflecting on impermanence of the five aggregates, we can gradually overcome suffering and defilements as well.

According to Buddhism, we can see an action or karma, also we can see a reaction or result (Vipāka), but there is no certain person who undergoes. Every thought arises and ceases at the moment. However every thought ceases at the moment conditioning next thought which arises next moment. First thought influences next thought, but first thought doesn't go to next thought. Our long Sansaric journey as well as this entire life exists in this way. According to conventional truth in Buddhism, we have a very long Sansaric process. Our previous actions, that we did a long time ago, can affect this life. Nevertheless, we only have thoughts occurring at the moment according to the ultimate truth. This is the nature of the impermanence that Buddhism explains. This is the wonder of our life whether we like or not. This is the reality of life whether we know or not. This is the world truth that nobody controls. This is a non-self-Karmic process. There is only pure process depending on cause and effect (the dependent origination).

There are four kinds of Karmas according to the *Sattamamamma Sutta* (AN,2,456p).

i. There is a Karma (Action) that is black which causes black result.
(*Atthi Bhikkhave kammam kaṇhaṃ kaṇha-vipākaṃ*)
ii. There is a Karma that is white which causes white result.
(*Atthi Bhikkhave kammam sukkaṃ sukka-vipākaṃ*)
iii. There is a Karma that is black & white which causes black & white result.
(*Atthi Bhikkhave kammam kaṇhasukkaṃ kaṇha-sukka-vipākaṃ*)
iv. There is a Karma that is neither black nor white which causes neither black nor white result which conduces to the destruction of actions
(*Atthi Bhikkhave kammam akaṇha-asukkaṃ akaṇha-asukka-vipākaṃ*)

The black or evil Karmas which we do with a wicked mind physically, verbally or mentally, produce black results. According to black Karmas, we are born in the four hells, and we have to suffer for a long time. White or wholesome Karmas we do with a pure mind as merits physically, verbally or mentally, cause white results. As the result of good karma or merit, we can be born in the heavenly or brahma realm for a long time with luxurious comforts. Further, as the results of Karmas that are black & white which produce black & white results, we are born in human realm where we experience a mixture of good and bad results. These first three actions no matter whether they are black (evil) or white (wholesomeness) depend on ignorance. As the result of good actions, we are able to be born in a blissful life in the human realm, heavenly realm or brahma realm. However, we are still not away from existance in the sansaric circle since in this level mental formations arise because of ingorance. Through ignorance are conditioned volitional actions or kamma-formations (*Avijjā paccayā samkhārā*). Therefore, we are unable to get rid of aging, death and rebirth in these levels. When the Buddha appeared in the world, though some people had realized the karmic law and though they could have achieved the brahma realm maximumly, they were unable to get rid of existance. After the

Buddha attained enlightenment, the Buddha realized another stage of action which overcomes the existance of Samsara.

At the beginning of our spiritual path, we have to overcome evil thoughts which bring us suffering. In the second step, we have to do good as generosity, virtue and meditation. Having a lot of merit as practicing good helps us to live with a lot of facilities in a blissful life like human, heavenly or brahma realms. Conversely, Buddhism always encourages us to do Karmas which cause us to overcome the Sansaric journey.

When a person does some actions volitionally which cause us to end the Sansaric existence, those actions are neither black nor white. Further, after a person is enlightened, his actions are also neither black nor white because it doesn't bring good or bad results. Actions which help us to overcome the existance are highly praised in Buddhism.

To overcome the Kamma and its result the Buddha proclaims the path which is the Noble Eightfold Path. In the Sammāditti sutta (M.N.), the Buddha very clearly explains the importance of understanding the Noble Eightfold Path to overcome the Sansāric circle. In short, the Buddha concludes those eight steps into two which are the tranquility (*Samatha*) and the insight (*Vipassanā*) meditation in Abhiññā Sutta (AN). The purpose of tranquility meditation is to keep focusing our mind in a particular wholesome thought such as breathing or loving kindness. When we practice our mind again and again using some kinds of meditation techniques, we can concentrate our mind for a long time without defilements such as desire or anger. As a result, we gain peace of mind and purification of mind that causes our happiness. If we can focus on impermanence with concentrated mind, arising and ceasing of five aggregates, this is the insight meditation which is unique only to Buddhism and it differs from all other religions and teachings. Both tranquility and insight meditations are very important for the purification our mind. If someone practices according to this message, he or she is able to get rid of all kinds of pain, sorrow and lamentation.

Understanding the four noble truths, the dependent origination and the five aggregates are interrelated. Here understanding the five aggregates {form (*Rupa*), feeling (*Vedanā*), perception (*Saññā*), mental formations (*Sankhāra*) and consciousness (*Viññāna*)} plays a main role.

We usually experience the world through our senses such as eyes, ears, nose, tongue, body and mind. When objects such as forms, sounds, smell, taste, touch and mental formations reach our senses, we experience the world. According to the conventional truth, though we don't experience, there is a world which consists of four elements; earth, water, fire and air. However, according to the ultimate (absolute) truth the world is alive when we experience the world. The world means arising of the five aggregates. If we don't experience the world through our senses, there is no world. That experiential world which differs from moment to moment is also alive according to our present mental condition. When we experience something through our six senses, the very first experience of arising of the five aggregates which is the result of our previous actions is instant. That very first experience is neither wholesome nor unwholesome. It, which is said as the behavior of consciousness (*Viññāna Cariya*), is just result of previous actions. Then if we are ignorant, that first experience goes to the behavior of ignorance (*Aññāna Cariya*). In this level the pure five aggregate have become the five grasping aggregates. It means above three actions; black, white, black & white have arisen. In this situation, we are in the samsaric circle since mental formations arise because of ignorance. If someone is mindful and wise reflecing on impermanence, suffering (unsatisfactoriness) and selflessness at the moment with the first experience, next experience goes to the behavior of wisdom (*Ñāna Cariya*). Then we are away from the Samsaric circle as well as suffering.

The nature of this experience is arising at the moment and ceasing instantly. Whatever we experience through six senses, five aggregates arise at that moment. Also, they immediately cease. Five aggregates are forms (*Rupa*), feelings (*Vedanā*), perception (*Saññā*), mental formations (*Sankhāra*) and consciousness (*Viññāna*). These five things arise together and cease together. They cannot be divided. We learn them by intelligence. These five aggregates, six internal senses or external objects are not permanent. They arise with the conditions at the moment, and they cease immediately when conditions separate. However, because of our ignorance we think they are permanent. Only wisdom can awaken us from this delusion. The nature of all conditions is that**; Not being occurred (in the past) comes to an occurrence. Being occurred (at the present) will not come to (the future) occurrence. (*ahutvā sambhutam hutvā na bhavissati*).** It means if we experience something now, it didn't happen in the past in the same way like now. Also, that present experience will not go to the future in the same way as well. If someone is clever to refect on impermanence of the five aggegates again and again at the moment, that present thought influences next thought to see the world correctly. Then little by little ignorance which take the world permanent ceases. As the result of practicing this path continuously, one day, we are able to experience everything as impermanent. Then we don't depend on anything or anyone. Also, we can live without any defilements among the ordinary people like a lotus flower which is over mud without evil what they touch. This is the real liberation what the Buddha taught.

Let's live happily without anger among the people who are angry.
Let's live happily without mental illnesses among the people who are mentally ill.
Let's live happily without longing for sensual pleasures among those who are seeking sensual pleasures.

This is the real way to make a refuge with one's mind and the Dhamma.

එක්සත් ජනපදයේ කොවීනාහි ලොස් ඇන්ජලිස් බෞද්ධ විහාරස්ථානයේ

**සත් දින ධර්ම සම්භාෂණය 03 වන දේශනය**

(2020 පෙබරවාරි මස 14 වන කිවි දින)

May the Triple Gem Bless you!

May All Beings be Mindful and Wise!

(Friday Dhamma Discussion of the Los Angeles Buddhist Vihara. Covina. 02/14/2020)